සියලු ම හිමිකම් ඇවිරිණි/ All Right Reserved / முழுப் பதிப்புரிமையுடையது

# ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය
# இலங்கை அபிவிருத்தி நிருவாக நிறுவகம்
# SRI LANKA INSTITUTE OF DEVELOPMENT ADMINISTRATION

**ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධරයන් සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය 2019(II)**

**කාලය : පැය 03**

**සංවර්ධන පරිපාලන පිළිබඳ ක්‍රියාවලිය (ශ්‍රී ලංකාව කෙරෙහි විශේෂ අවධානය සහිතව) (15)**

විභාග අංකය
Index No / சுட்டெண்
.........................................

- ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

1. ශ්‍රී ලංකාවේ සංවර්ධන පරිපාලන ක්‍රියාවලිය වඩාත් ශක්තිමත් කිරීම සහ මහජන කේන්ද්‍රීය රාජ්‍ය ප්‍රතිපත්ති හඳුනාගෙන ක්‍රියාත්මක කිරීම සඳහා ඔබ යෝජනා කරන රාජ්‍ය සේවා ප්‍රතිසංස්කරණ විස්තර කරන්න. (ලකුණු 20)

2. ජාතික ආර්ථික සමාජීය සංවර්ධනය සඳහා රාජ්‍ය ව්‍යාපාරවලින් ඉටුවන සහ ඉදිරියේදී ඉටුවිය යුතු කාර්යභාරය පිළිබඳව උදාහරණ සහිතව සාකච්ඡා කරන්න. (මෙහිදී යටිතල පහසුකම්, සමාජ සංවර්ධන, ආර්ථික සංවර්ධනය යන ක්ෂේත්‍ර ආවරණය වන ආකාරයට අවම වශයෙන් උදාහරණ හතරක් සහිතව පැහැදිලි කිරීම අපේක්ෂා කෙරේ.) (ලකුණු 20)

3. ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය සංවර්ධනය සඳහා දහතුන් වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මඟින් බලය විමධ්‍යගත කිරීමෙන් ඇතිවූ බලපෑම සහ මුහුණපාන ගැටලු විචාරාත්මකව විමසන්න. (ලකුණු 20)

4. i. යටිතල පහසුකම් සංවර්ධනයේ දී ශ්‍රී ලංකාව මුහුණපාන අභියෝග පැහැදිලි කරන්න. (ලකුණු 08)

   ii. ශ්‍රී ලංකාවේ යටිතල පහසුකම් සංවර්ධනයේ දී රාජ්‍ය හා පුද්ගලික හවුල්කාරීත්වය (Public Private Partnership) ප්‍රමුඛ ආයෝජන ප්‍රවනතාවක් බවට පත්වෙමින් ඇත. ඒ මඟින් ලබා ගත හැකි ප්‍රතිලාභ උදාහරණ සහිතව විශ්ලේෂණය කරන්න. (ලකුණු 12)

5. පහත දක්වා ඇති මාතෘකා අතුරින් දෙකක්(02) පැහැදිලි කරන්න.

   i. සංවර්ධන පරිපාලනයේ මූලිකාංග (Elements)

   ii. ශ්‍රී ලංකාව සංවර්ධනය කිරීමේ ඉලක්ක සපුරාලීමේ දී දේශපාලන ස්ථාවරභාවයේ වැදගත්කම

   iii. ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වෙමින් පවතින රටක සංවර්ධනය සඳහා පරිපාලනයේ කාර්යභාරය (ලකුණු 10x2 = 20)

6. රාජ්‍ය අංශයේ කළමනාකරුවෙකු වශයෙන් ඔබ දකින ආකාරයට ශ්‍රී ලංකාවේ රාජ්‍ය ආයතනවල ක්‍රියාකාරීත්වය යහපාලන මූලධර්මවලට අනුකූල වන ආකාරය විවේචනාත්මකව විමසන්න. (ලකුණු 20)

7. ව්‍යවසායකත්වය රටක ආර්ථිකය දරා සිටින එක් කුලුනකි. රට තුළ ව්‍යවසායකත්වය සඳහා සුදුසු පරිසරයක් (Conductive Environment) ඇති කිරීමේ දී සංවර්ධන පරිපාලකයා සතු කාර්යභාරය ශ්‍රී ලංකාව කෙරෙහි අවධානය යොමු කරමින් විග්‍රහ කරන්න. (ලකුණු 20)

***********